# පැරණි පුවත්පත් මතකයන්

## මුදල් ඇමති බිරියගේ තෑගි සඳහා
# අපේ මුදල් ඇයි?

**ඇත්ත පුවත්පතේ කතුවරයා වූ බී ඒ සිරිවර්ධනයන් විසින් 1986/12/29 දින ලියන ලද කතුවැකියකි**

පිළිතුරු පතාගෙන ප්‍රශ්නයක් අසමු. ප්‍රශ්නය ගරු මුදල් ඇමතිතුමාගෙන් අප අසන්නේ අපි හරියටම නොදන්නා නිසයි.
මුදල් ඇමතිතුමාගේ බිරිය වන එතුමියගේ පෞද්ගලික ලේකම්තුමිය කාට දෝ තෑගි දෙන්නට මිල දී ගත් රුපියල් විසි දහසක් වටිනා රත්තරන් බඩුවලට මිල ගෙවා ඇත්තේ මුදල් ඇමති තුමාගේ පාලනය යටතේ පවත්නා මහා භාණ්ඩාගාරයයි. මහා භාණ්ඩාගාරයේ තිබෙන්නේ ශ්‍රී තියක සන්ද වත්තේ ආදායම නො ව මහජනතාව ගේ මුදල් ය. මහජනතාව ගේ මුදලින් ඒ විදියේ තෑග්ගක් ඇයි...? කාට කුමක් සඳහා ද..?

සමහර විට මේ තෑගි භාණ්ඩ පිටරටින් පැමිණි නියෝජිත පිරිසකට පිරිනැමීම සඳහා මිල දී ගන්නා විය හැකි යි. පිටරටින්ආ නියෝජිතයනුත් ඔවුන් පිළිගන්නා මෙරට නියෝජිතයනුත් අතරේ තෑගි බෝග හුවමාරු කරගැනීමේ සිරිතක් ඇති බව අප දනිමු. පිට රටින් හෝ ජාත්‍යන්තර සංවිධානයකින් පැමිණි නියෝජිත පිරිසකට හිලිණ වශයෙන් දීම සඳහා යමක් තෝරා ගත යුතු නම් එය රත්තරන් බඩු ම විය යුතු ද...?

පෞද්ගලික සංවිධානයක් නම් රත්තරන් බඩු නොව අලි ඇතුන් තෑගි දුන්නත් වරදක් කිව නො හැකි යි. ඒ සඳහා මිල ගෙවනු ලබන්නේ එම ආයතන වල පෞද්ගලික මුදලින් බැවිනි. එහෙත් පෞද්ගලික සංවිධානයක් වුව ද පිටරටියකුට තෑගි දීම සඳහා සාමාන්‍ය වශයෙන් තෝරා ගනු ලබන්නේ රන් රිදී බඩු නොව ශ්‍රී ලංකාව සංකේතවත් කරන අත්කම් භාණ්ඩයක් වැනි දෙයකි. කළුවර ලීයෙන් කළ අලියකු, රිදී ආලේප කළ බන්දේසියක්, වෙස් මුහුණක්, වල්ලා පට්ටා භාජනයක්, වැනි දෙයක් මිස රන් රිදී බඩු තෑගි දීමක් ගැන සාමාන්‍යයෙන් අසන්නට නොලැබේ. පිටරටියෙකුට වුවමනා නම් රන් රිදී බඩු ලොවේ කොතැනකින් වුව ද ලබා ගත හැකි ය. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නියෝජිතයකු රත්තරනට වඩියෙන් අගය කරනු ඇත්තේ ශ්‍රී ලංකාව සංකේතවත් කරන ශ්‍රී ලංකාවට ම ප්‍රවේණික වූ කලා අත්කම් භාණ්ඩයකි.

විශේෂයෙන් ම මුදල් ඇමති තුමා හමුවීමට පැමිණෙන්නෝ පිටරට හොඳ සල්ලිකාරයෝත්, සල්ලිකාර ආයතන වල නියෝජිතයෝත් ය. බොහෝ විට ඔවුන් පැමිණෙන්නේ මුදල් ඇමතිගේ යාවක ආයාචනා ගැන සලකා බලා ණයක් දිය යුතු දැයි සොයා බැලීමට ය. එවැනි අය නියාජ්‍යයෙන්ගෙන් රත්තරන් තෑගි ලැබූ බත්වත් බලාපොරොත්තු නො වන බව කිව මනා නොවේ.

කොයි හැටි වෙතත් රත්තරන් ම දෙන්නට උවමනා නම් මුදල් ඇමති ගේ පෞද්ගලික මුදලින් වියදම් දරනු මිස, ඒ සඳහා මහජන මුදල් වැය කිරීම සුදුසු ද? මුදල් ඇමති තුමාගේ පෞද්ගලික ලේකම්වරිය තෑගි දීම සඳහා යැයි මහජන මුදලින් රත්තරන් බඩු මිල දී ගත් පළමු අවස්ථාව මෙය නොවන බව අපි අසා ඇත්තෙමු. කෙසේ වුවද මේ විදිහටම රත්තරන් තෑගි දෙන්නට ගියහොත් මුදල් ඇමති ලොව වටේ ගිහා කා ලබාගන්නා මුදලින් කොතරම් ප්‍රමාණයක් රටට ඉතිරි වේද? අපින් අපට රත්තරනින් තෑගි දෙන්නට වත්කම් ඇති ඒ වැනි රටකට හිඟාකන් දෙන්නේ අපටත් විහසට දැයි අපට ආධාර දෙන රටවල් සිතුවොත් පත්තිවිය කුමක් ද?

තෑගි බඩු යැයි දාත්වෙනු විනා කවරෙකුට දෙන තෑගි දැයි නො දාත්වෙන හෙයින්, මුදල් ඇමතිතුමා ගේ බිරිය මේ රත්තරන් බඩු මිල දී ගෙන ඇත්තේ ඇය ගේ හැඳ. හිත මිතු කෙනෙකුට දීම සඳහා යැයි ද සාමාන්‍ය මිනිසුන් තුළ සැකයක් ඇති වන්නට බැරි නැත. මේ ගැන අප පිළිතුරු ඉල්ලා සිටින්නේ එහෙයිනි.

මෙවැනි කරුණු හෙළි කරන විට, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න අසන විට මේ උත්තමයන්ට, උත්තමාවියන්ට සෑහෙන්න කෝන්ති යන බව අපි දනිමු. අප මෙය ලියන්නේ ඒ කෝන්තියට අප ගොදුරු විය හැකි බව දැනගෙන ය. අපට විරුද්ධව නඩු පවරන්නට පුළුවන. නඩු විනිසුරුතුමා එයට ආදර්ශය දී ඇත. මිනු ගැන විවේචනයක් ලිව්වොත් අපට විරුද්ධව නඩුවකි. එහෙත් නඩු දමා තිබ්බට නොව එල්ලුම් ගස් ඇරියත් කිව යුත්ත කිව යුතු යි. ඇසිය යුත්ත ඇසිය යුතුයි.

ගරු මුදල් ඇමති තුමා කිසි කෙනෙකු තරමට සුළුදෝ සුදු පුද්ගලෙකි. ඔහු අපට දී ඇති හැඟීම එය යි. එතුමා යටතේ ඇති රාජ්‍ය බැංකු වල ප්‍රචාරක හා අන තැනුත් කටයුතු වලදීත් විදේශික බැංකු මෙහි පිහිටුවීමට අවසර දීමේදීත් ඒ තුමා එය මැනවින් ප්‍රදර්ශනය කර ඇත. ඒ බැවින් මෙම ස්වර්ණාභරණ ගනුදෙනුවේ පුතුමුනු රටට පාදා දීම ඒ තුමා ගේ වැඩි ගෞරවය පිණිස වෙයි. මේ රන් ආභරණ මිලදී ගත්තේ කාට තෑගි දෙන්නට ද? ඒ වැනි තෑග්ගක් දිය යුතුම වී ද? හේතුව කිමෙක් ද?

අද මහජන මුදල් ගසා කනු ලබන ප්‍රමාණයක් කොත්ලාත් වලින් කොමිස් කුට්ටි ලබන ප්‍රමාණයක් අනුව බලන විට රුපියල් විසි දහසක් යනු හිතම් මාරු කායි බව අපි පිළිගනිමු. එහෙත් මෙහිදී ඇත්තේ මුදලේ ප්‍රමාණය නොව ප්‍රතිපත්තිය යි. එයට පිළිතුරු අපි මුදල් ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙමු.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වී ප්‍රජාතන්ත්‍රයට බැඳුණු මුදල් ඇමති රොනි ද මෙල් මහතා ශ්‍රීලනිප යේ සිඩුණු දූෂණ වලට පහර ගසන ආකාරයෙන් අපට සිතා ගන්නට තිබෙන්නේ ඔහු තරම් පිරිසිදු පුද්ගලයෙකු මේ දිවයින තැනි බවය. ඒ නිසා අප නැගූ ප්‍රශ්නයෙන් මග හරින්නට ඔහුට කිසිම හේතුවක් නැති සේ අපට පෙනේ.

ලොකු ඇත්තන්ට කෝන්ති ගිය විට දැන් වරප්‍රසාද කෙටිට ද නිතර ම මතක් කෙන එනු ලැබේ. මුදල් ඇමතිතුමා ගේ බිරිය කළ ගනුදෙනුව නිවැරදි නම් ඔහු එසේ නො කරනු ඇතැ යි අපි බලාපොරොත්තු වමු. බයට නො වේ. අප සා ගේත් යහපත සඳහා යි. අපත් මේ ප්‍රශ්න මතු කරන්නේ අප සතු වරප්‍රසාද අනුව බව සදුරුත් මතක තබා ගත යුතුය. එය පහත පොතක ලියා වී ඇති වරප්‍රසාදයක් නොවන බව සැබෑ ය. එහෙත් ජනතාව වෙනුවෙන් කතා කිරීමත්, ජනතා අයිතියට පටහැනි සියලු වියකලාප විරෝධය පෑමත් ජනතාවගේ පත්‍රයට ඇති වරප්‍රසාදයකි.

